# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT - COLOMBO 12
29 MAY 2020

මගේ අංකය - PS/GPA/02/28
2020 මැයි මස 26 වන දින

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

**වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම**

1985 අංක 29 සහ 1988 අංක 74 දරන පනත්වලින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ 4 (අ) (iii) වගන්තිය අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන විනිශ්චයකාරවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ එතුමා වෙත ඉදිරිපත් කළයුතු වේ.

උක්ත පනතෙහි 3 (3) වගන්ති ප්‍රකාරව <u>කිසියම් වර්ෂයක මාර්තු මස 31 වන දිනට පැවති වත්කම් හා බැරකම් ප්‍රකාශයන් එම වර්ෂයේ ජූනි මස 30 වන දින වනවිට ඉදිරිපත් කළයුතු බැවින්</u>, 2020 වර්ෂයේ ජූනි මස 30 වන දින වනවිට එම වර්ෂයේ මාර්තු මස 31 වන දින පැවති පරිදි වූ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයන් නියමිත ආකෘති පත්‍රයේ සම්පූර්ණ කර අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු විනිශ්චයකාරවරුන්ගේ අවධානයට යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

තව ද, එම වත්කම් හා බැරකම් ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් අංක 1 3 දක්වා කරුණු පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමුකරන මෙන් වැඩිදුරටත් දන්වමි.

1. වත්කම් හා බැරකම් ප්‍රකාශය යොමු කරනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පහත කරුණු සඳහන් කළයුතු වේ.
   - 1.1. "<u>වත්කම් හා බැරකම් ප්‍රකාශය</u>" යනුවෙන් සහ එම වත්කම් බැරකම් ප්‍රකාශය අයත් අයගේ නම හා තනතුර.
   - 1.2. වත්කම් හා බැරකම් ප්‍රකාශය කුමන වර්ෂයකට අදාළව ඉදිරිපත් කරන්නේ ද යන්න.
     (උදා :- 2019.03.31 දිනට අදාළව යොමු කරනු ලබන වත්කම් හා බැරකම් ප්‍රකාශයෙහි අදාළ වර්ෂය 2018/2019 ලෙස සඳහන් කළ යුතුය.)
2. වත්කම් හා බැරකම් ප්‍රකාශය සමඟ යොමු කරනු ලබන ආවරණ ලිපිය එම ප්‍රකාශය අඩංගු කවරය තුළට නොදමා වෙන්ව විවෘත කළ හැකි පරිදි යොමු කළයුතු වේ.
3. සියලු වත්කම් හා බැරකම් ප්‍රකාශයන් <u>මුද්‍රා තබා, රහස්‍ය තැපෑල</u> මඟින් ඉදිරිපත් කළයුතු වේ.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය අගයකොට සලකමි.

චන්දිමා වික්‍රමසිංහ
ජනාධිපති අතිරේක ලේකම්
ජනාධිපති ලේකම් වෙනුවට


ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: 011 2354354, 011 4354354

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2340340

ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: ps@presidentsoffice.lk


25